# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2026.03.09 පැය 0535 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/ 414 /2026 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු</u>

**01. රිවෝල්වර් අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - කඩුවෙල පොලිස් ස්ථානය.**

2026.03.08 දින දහවල් කඩුවෙල පොලිස් වසමේ වැලිවිට ප්‍රදේශයේදී කඩුවෙල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර විදේශ රටක නිශ්පාදිත රිවෝල්වර් අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 47 ක් වන වැලිවිට, කඩුවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

කඩුවෙල පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. කුෂ් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය.**

2026.03.08 දින රාත්‍රී කටුනායක බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපලේ පැමිණීමේ පර්යන්තයේදී පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර **කුෂ් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 02 ග්‍රෑම් 762 ක් සමඟ** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන ඉන්දියානු ජාතිකයෙකි.**

පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය ගුවන්තොටුපල ඒකකය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. දරුවෙකු දියේ ගිලී මියයාමක් - පොල්පිතිගම පොලිස් වසම.**

2026.03.08 දින සවස පොල්පිතිගම පොලිස් වසමේ කිරිබමුණේගම යාය ප්‍රදේශයේදී වගා ළිඳකට වැටී දරුවෙකු මියගොස් ඇති බවට පොල්පිතිගම පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 10 ක් වන සෙම්බුකුලිය, කැකිරාව ප්‍රදේශයේ පදිංචි දරුවෙකි.**

මියගිය ළමයා සෙල්ලම් කරමින් සිටින අවස්ථාවේ නිවස පිටුපස අනාරක්ෂිතව පිහිටි වගා ළිඳට වැටී මෙම අනතුර සිදුව ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

පොල්පිතිගම පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 04. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - දොඩන්ගොඩ පොලිස් ස්ථානය.

2026.03.08 දින අළුයම් කාලයේ දොඩන්ගොඩ පොලිස් වසමේ හර්මන්වත්ත ප්‍රදේශයේදී දොඩන්ගොඩ පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 225 ක් සන්තකයේ තබාගෙන ත්‍රීරෝද රථයකින් ගමන් කරමින් සිටි සැකකරුවෙකු ත්‍රීරෝද රථයද සමග අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 27 ක් වන දොඩන්ගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

දොඩන්ගොඩ පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 05. ගෝඩා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මොරගහහේන පොලිස් ස්ථානය.

2026.03.08 දින සවස මොරගහහේන පොලිස් වසමේ පිටවිල ප්‍රදේශයේදී මොරගහහේන පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් වැටලීමක් සිදුකර නීතිවිරෝධී මත්පැන් පෙරීමට ගන්නා ගෝඩා ලීටර් 1278 (බැරල් 07)ක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 49 ක් වන ගෝනපොල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මොරගහහේන පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 06. යතුරුපැදියක් ත්‍රීරෝද රථයක ගැටී යතුරුපැදියේ පසුපැදිකරු ජීවිතක්ෂයට - අක්කරපත්තුව පොලිස් වසම.

2026.03.08 දින උදෑසන අක්කරපත්තුව පොලිස් වසමේ අක්කරපත්තුව කල්මුණ මාර්ගයේ අඩ්ඩාලච්චේන ප්‍රදේශයේදී කල්මුණ දෙසට ධාවනය වූ යතුරුපැදියක් ත්‍රීරෝද රථයකට ඉස්සර කිරීමට යාමේදී එම ත්‍රීරෝද රථයේ ගැටී පෙරලී ගොස් විදුලි රැහැන් කණුවකද ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකරු බරපතල තුවාල ලබා අක්කරපත්තුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 20 ක් වූ අඩ්ඩාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අක්කරපත්තුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. බස්රථයක් යතුරුපැදියක ගැටී යතුරුපැදියේ පසුපැදිකරු ජීවිතක්ෂයට - මින්නේරිය පොලිස් වසම.

2026.03.08 දින රාත්‍රී මින්නේරිය පොලිස් වසමේ හබරණ මඩකලපුව මාර්ගයේ රජඇල ප්‍රදේශයේදී පොළොන්නරුව දෙසට ධාවනය වූ බස් රථයක් යතුරුපැදියකට ඉස්සර කිරීමට යාමේදී එම යතුරුපැදියේ ගැටී අනතුරක් සිදුව

ඇත. අනතුරින් යතුරුපැදිකරු හා පසුපැදිකරු බරපතල තුවාල ලබා පොළොන්නරුව රෝහලට ඇතුලත් කිරීමෙන් පසු පසුපැදිකරු මියගොස් ඇත.

**මරණකරු අවුරුදු 20 ක් වූ අඹඩාලච්චේන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අක්කරපත්තුව පොලිසිය විසින් වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**